# ශ්‍රී ලංකාවේ වීදි නාට්‍ය මූලාරම්භක ජී. කේ. හත්තොටුවේගම ගුරු පියාණෝ

"මිනිසාගේ තනතුරු, බලතල, වත්කම් ඉවත් කළ පසු ඔහු තුල සිටින්නේ සාමාන්‍ය මිනිසකු පමණි." යන සුප්‍රසිද්ධ කියමනට අනුරූපීව ගාමිණී හත්තොටුවේගම ගුරු පියාණන් තම ශේෂ වූ ආයු කාලය තුළ ඉහතින් සඳහන් කළ චංචල සියලු ආභරණ පසෙක ලා සාමාන්‍ය මිනිසකු වශයෙන් තම ජීවිතය ගත කිරීම කොපමණ ආශ්චර්යජනකද යන්න ඔහු ළඟින් ඇසුරු කළ අපි කවුරුත් ප්‍රත්‍යක්ෂයෙන් දනිමු.

ඔහු සතු ධනය වූයේ අසාමාන්‍ය නව චින්තාවනුත්, සමාජානුයෝගී බවත්, කිසි භේදයකින් තොර සමාන සමාජ සිතුවිලිත්, අඩුම කුඩුම, පොත්පත්, පෑනක් හා ඇඟලුම් කිහිපයක් පුරවාගත් "හවා" මල්ලත්, ගමනට හා කුස පුරවා ගැනීමට අවශ්‍ය කාසි කිහිපයකුත් පමණි.

නවසිය ගණන්වල මැද භාගයේ පමණ විදුලකර සරසවියට ඇතුල් වී සති කිහිපයක් යාමට ප්‍රථම ගුරුන් අතර සුවිශේෂ ගුරුතුමෙක් දළුගම සරසවි මණ්ඩපයේ සැරිසරනු මම දුටුවෙමි. උඩුකය අඳුරු වර්ණයකින් හා බොත්තම් පිරි සාක්කු කිහිපයකින් සැදුම්ලත් කමිසයකින්ද, එම කමිසයේ ලිහුණු බොත්තම් අතරින් නිරාවරණය වූ පපු ප්‍රදේශයේ කලු ලේස් නූලකින් ගැටගැසුණු තඹ පැහැති රෝම කාසියද පෙරළෙමින් තිබුණි. සෙන් පරපුරේ රජ කුමරුන්ගේ දිගටි නෙත්, ඉහළ සිට පහළට ඇදුණු තලෙළු වර්ණවත් වූ දිගටි යුදෙව් මුහුණකින් හෙබි උස් වූ කෙසඟ සිරුර ඈතින් අඩි තබමින් ගමන වේගවත් වූයේ "ට්‍රෑම්" රථ යක් මෙනි. ඔහුට ආභරණ වූයේ ඔහු සතු සුවිශේෂ වූ පෞරුෂයයි.



*ගාමිණී හත්තොටුවේගම ගුරු පියාණන්*

දළුගම බණ්ඩාරනායක ශිෂ්‍ය නේවාසිකාගාරයේ සිසුන් පිරිවරාගෙන ඔහු ගතකළේ ශිෂ්‍යයකු මෙනි. වෙනසකට වූයේ ඉංග්‍රීසි සාහිත්‍ය පිළිබඳ හසල දැනුම හා නව නාට්‍ය චින්තාවන්, සංකල්පයන් පළිබඳ පැවති පර්යේෂණාත්මක අදහස් පමණි. ඔහුගේ ජීවිතයෙන් වැඩි කාලයක් මහමගට වැයවූයේ අන්කිසිවක් නිසා නොව ඔහු සතු අත්දැකීම්, සාමාන්‍ය ජීවිතයෙන් උරා ගැනීමට ගත් උත්සාහයයි. සිසුන් පිරිවරාගෙන සම්භාව්‍ය ඉංග්‍රීසි චිත්‍රපට හා නාට්‍ය නැරඹීම, සාහිත්‍ය නාට්‍ය වැඩමුළු සඳහා උචිත තානාපති කාර්යාල කරා පියනැගීම, පුවත්පත් කාර්යාල, ගුවන් විදුලිය, ලුම්බිණි රඟමඩල, ගම් නියම්ගම්, වෙල්වෙළි, කමත්, ගොවීන්, කම්කරුවන්, සාමාන්‍ය ජනතාව මෙකී නොකී පරිසරයන් හා පුද්ගලයන් මුණගැසී ඔහුටත්, සිසුන්ටත් ළඟා කර දුන් අත්දැකීම් අපමණය. අද වත්මන් කුලී නිවසේ සිට සුවිසල් මැදුරුවල දිවි ගෙවන ලංකා ධරනි තලයේ සුප්‍රසිද්ධියට පත් ගෝලයන්, නාට්‍ය නිෂ්පාදකයන්, නළුවන් සියදහස් ගණනින් මනාව පසක් වනුයේ,

"…..සිප් කිරි පෙවූ ….. උඩු මහලේ

අපෙ ගුරුතුමා යයි තවමත් මහ පාරේ" යන ගායනා රාවයයි.

1966 දළුගම විශ්ව විද්‍යාලයේ ප්‍රථම කලා උළෙලේ නාට්‍ය තරඟයට පෙර වදනක් සපයමින් සරසවි සිසුන් කිහිප දෙනෙකු එක්රැස් කර ගෙන ජී.කේ. සර් "කොබෙයි රැළක් රංචු ගසා නගින්නේ….// නිල් අහස කඩා යන පිළිහුඩුවා….// වනයේ ගිරවා හොට රතු කෙරුවා….// කොබෙයි රැළක්…." යන කෙටි නාට්‍යෝචිත කෙටි පිවිසුම අවසන් වන විට මහ සිසු කැළ අත්පොලසන් දෙමින් ගෞරවය පල කළ සැටි අද මෙන් මතකයට නැගේ. එතුමාගේ වීදි නාට්‍යවල මූලාරම්භය මෙය බව ඊට සහභාගී වූ මා සමග එතුමා කීපවාරයක් පවසා තිබේ.

නවසිය හැටගණන්වල විදුලකර සරසවියේ ක්‍රිකට් ක්‍රීඩාව ශක්තිමත් කිරීමට එතුමා ශ්‍රමයත්ත ධනයක් නොතිබුණු සිය වේතනයත් කැප කළේය. 1966/67 විදුදය - විදුලකර මහා ක්‍රිකට් ගැටුමේ විදුලකර ක්‍රීඩකයන් ප්‍රදර්ශනය කළ ශක්තිමත්භාවය එකල පුවත්පත්වල පළවීමේ ගෞරවය එතුමාට හිමිවේ. ඡ්බෝ කදකකැටෑ සමග කළ ක්‍රිකට් සටන්, ඡ්සකහ හැඅි ඔරදවයහ ක්‍රිකට් සටන් සදා අමතක නොවේ.

1973 මා අනුරපුර විදුහලක උගන්වන අවදියේ ජී. කේ. සර් පරාක්‍රම නිරිඇල්ලගේ කළමණාකාරිත්වයෙන් එච්. ඒ. පෙරේරා, දීපානි සිල්වා, හෙට්ටිආරච්චි ආදීන්ගේ සහභාගිත්වයෙන් පුන් පෙසොන් පෝ දින සඳවිළියේ හරිස්චන්ද්‍ර ක්‍රීඩා පිටියේ සහ ජනාකීර්ණ අනුරාධපුර දුම්රියපොළේ රඟ දැක් වූ වීදි නාට්‍ය සංදර්ශන ආරම්භක සංදර්ශන ලෙස ඉතිහාසයේ සනිටුහන් වී ඇත.

මෙම අසාමාන්‍ය සත්පුරුෂයාට මා පෙර සඳහන් කළ පරිදි බුද්ධිය හා ඔහුගේ ගෝලබාලයන්ගේ, සොයුරියන් හා දරු දෙදෙනාගේ (දැනට ඕස්ට්‍රේලියාවේ ගත කරන) සත්කාර හැර අන්කිසි දේපළක්, වත්කමක් නොවීය. ඔහුඃ මනරම් මාළිගා තැනූ බ්‍රේස්ලට්, මාල පැළඳූ යානවාහන හිමි කරුවකු නොවීය. ඔහු සතු වූයේ ඔහුට පමණි. නමුත් අගය කළ යුත්තක් ඇත. විදුලකර සරසවියේ මේ අන්දමට ගෙවී ගිය ස්වර්ණමය යුගයේ සිටි ජ්‍යෙෂ්ඨයන් හා වත්මන් පාලක මණ්ඩලය මෙතුමා මියයන්නට පෙර මෑත අතීතයේ පැවැත් වූ උපාධි ප්‍රදානෝත්සවයේදී එතුමාට ආචාර්ය උපාධියක් පිරිනැමීම කොපමණ අගය කළ යුත්තක්ද කෘතගුණ සැලකීමක්ද!

ශ්‍රී ලංකා ද්වීපයට වීදි නාට්‍ය හඳුන්වා දී එය සංස්කෘතික අංගයක් බවට පත් කිරීමට වෙරදැරූ අපේ ගුරුතුමාට නිවන් සුව අත්වේවා!

**සුනිල් අබේසේකර**
**වික්ටෝරියා, මර්න්ඩා**

**විදුලකර සරසවිය (1965-70)**
**ශ්‍රී ලංකාව 94 33 22 26942**

MIGRATE TO AUSTRALIA
MULTINATIONAL MIGRATION SERVICES & AUSTRALIAN MIGRATION SERVICES
The First Registered Migration Agent for Sri Lanka
Listed in the registry of Migration Agents Registration Authority (MARA) in Australia

ONSHORE
- Graduate skilled visa
- Student visa renewal
- Change visa subclass
- Family sponsored visa
- Skills assessments
- Change course provider
- Partner visa
- MRT (Review application)

OFFSHORE
- Skilled visa
- Student visa
- Visit visa
- In house IELTS
- Business visa
- Spouse visa
- Parent visa
- Appeals

Special rates & terms available for international students
"EXPERIENCE THE DIFFERENCE"
Affordable fees & easy payment terms

Meet our qualified consultants with **years of experience** who can deliver the **results**
Senior Migration Consultants:
Hirosh Hemantha Gamage MARN 0320696 Peter Russell Loughton MARN 9789986

Tel: 03-94377384
4/45, Ancona Drive, Mill Park, Victoria 3082, Australia.

Consultation by Appointment only

Tel: 011 5 500 100
245, 3rd Floor, Dharmapala Mawatha, Colombo 07, Sri Lanka.

For More Details or Free Online Assesment Visit Our Website
www.multinational.com.au
E-mail : info@multinational.com.au

MIA MEMBER OF MIGRATION INSTITUTE OF AUSTRALIA
MIGRATION AGENT REGISTERED mara.com.au REGISTRATION NUMBER 0320696